(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 7.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 දෙසැම්බර් 18 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

2/2024

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජය සතුව පවතින ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා ලිපින වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් ගොවිපළෙන් උපයන ලද ලාභ/ අලාභ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එළැඹි එකඟතා ගිවිසුම අනුව ඉහත ගොවිපළවල ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

58/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම එක් එක් දුම්රිය එන්ජිමේ අංකය සහ නිෂ්පාදිත රට වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් දුම්රිය එන්ජින් අතරින් ධාවනයට එක් කර ඇති දුම්රිය එන්ජින් සංඛ්‍යාව හා ධාවනයට එක් කර නොමැති එන්ජින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දුම්රිය එන්ජින් ධාවනයට එක් නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත සඳහන් දුම්රිය එන්ජින් ආනයනය කිරීමේදී විශාල වංචාවක් සිදු වී ඇති බවට නැගෙන චෝදනා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

65/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පඩුවන්කරෙයි සහ එළුවන්කරෙයි ප්‍රදේශ සම්බන්ධ කරනු ලබන ප්‍රධාන පාලමක් වන මණ්ඩූර්-කුරුමන්වෙලි පාලම ඉදිකිරීම සම්බන්ධයෙන් මුල්ගල් තැබීම හැර මේ දක්වා වෙනත් පියවරක් ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, මේ දක්වා ඉහත පාලම ඉදි නොකිරීමට හේතු කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි-නිරිත, මන්මුනෙයි-දකුණ එරුවිල්පත්තු සම්බන්ධ කරනු ලබන අම්බිලාන්තුරෙයි, කුරුක්කල් මඩම් පාලම අලුතින් ඉදිකිරීම සඳහා මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, මේ දක්වා ඉහත පාලම ඉදි නොකිරීමට හේතු කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කෝරළේපත්තු-දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිගිලිවෙට්ටෙයි-සන්දිවෙලි පාලම සහ එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුන්නක්කුඩා-කලුවන්කේනි පාලම අලුතින් ඉදිකිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

78/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා වී අලෙවි මණ්ඩලය ලැබූ ලාභ/අලාභ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළදී එම මණ්ඩලය අලාභ ලබා තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

86/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර ඇති බඩඉරිඟු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ බඩඉරිඟු ආනයනය කර තිබේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ බඩඉරිඟු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

97/2024

ගරු චාමර සම්පත් දසනායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජයේ පළමුවැනි අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කළ පරිදි ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) එම ආනයනය කරන ලද සහල් පාරිභෝගිකයන්ට අලෙවි කරනු ලබන මිල කොපමණද;

(iii) රජයේ හා පෞද්ගලික අංශයේ ගබඩාවල ඇති වී සහ සහල් තොග පිළිබඳ දත්ත රජය සතුව තිබේද;

(iv) වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දී තිබියදීත්, සහල් ආනයනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

100/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී මිලදී ගැනීම සම්බන්ධයෙන් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) රජය විසින් මෙවර මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) එම වී තොග ගබඩා කරනු ලබන ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වී මිලදී ගැනීම සම්බන්ධයෙන් පනවා ඇති අවම මිල එක් එක් වී වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මිල ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

108/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබුණු සෘජු විදේශ ආයෝජන සංඛ්‍යාව සහ වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

130/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට 2022 දක්වා රජය සහ පෞද්ගලික අංශය විසින් කොවිඩ්-19 සඳහා සිදු කරන ලද මුළු ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ සහ පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (පී.සී.ආර්.) පරීක්ෂණ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පරීක්ෂණ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි වූ දේශීය නියෝජිතයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ සහ පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (පී.සී.ආර්.) පරීක්ෂණ එක් ඒකකයක් සඳහා රජය විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පරීක්ෂණ සඳහා රජය විසින් දරන ලද මුළු වියදම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

144/2024

ගරු දේවානන්ද සුරවීර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මග නැඟුම ආයතනය වසා දැමීමට තීරණය කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ආයතනයට අයත් චංචල සහ නිශ්චල දේපළ පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) මේ වනවිට එම ආයතනය සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග තිබේද;

(iv) අංක HC (CIVIL) 32/2023/CO දරන නඩුවක් එම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන්නේද;

(v) එම නඩුව වෙනුවෙන් මේ වනවිට ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2025 ජනවාරි 07 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

පරිපූරක මුදල,— ශීර්ෂය 102 — වැඩසටහන 01 — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2024 දෙසැම්බර් 17),— "† 2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හයදහස් පන්සියයක් (රු.6,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **102** | - | මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා (2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් අමාත්‍යාංශ නාමය දක්වා ඇත) | |
| **වැඩසටහන** | **01** | - | මෙහෙයුම් වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 6,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 6,500,000,000** " |

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

† 2024 දෙසැම්බර් 05 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 14 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 13 දක්වා එකතුව රු. 228,123,000,000

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නිවේදනය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ජේ. ජේ. ටෙක්ස්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 අගෝස්තු 26 දිනැති අංක 2399/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.12.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 117 — වැඩසටහන 02 — † 2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තිස්තුන් දහස් අටසිය දහහතකට (රු. 33,817,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **117** | - | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය<br>(2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් අමාත්‍යාංශ නාමය දක්වා ඇත) | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | <u>රු. 33,817,000,000</u> |
| | | | **මුළු වියදම** | **<u>රු. 33,817,000,000</u>** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2024 දෙසැම්බර් 06 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 15 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 14 දක්වා එකතුව රු. 234,623,000,000

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***